# මාතෘ හා ළදරු මරණ අනුපාතිකය ඉහල දමන හෙද සංගම් යෝජනාවට කෙසේ නම් එකඟ වෙමුද ?

- ශ්‍රී ලංකාවේ මාතෘ මරණ අනුපාතිකය 27.5 කි (දරු උපත් 100,000 ක් සඳහා). මෙය ලොව 66 වන තැන ගනී. දකුණු ආසියාතික කලාපයේ අනිකුත් සියලු රටවල් අප විසින් පහසුවෙන් අභිභවා ඇත. ඉන්දියාවේ මෙම අගය 200 වන අතර ඇෆ්ගනිස්ථානයේ එය 400 කි.

- අප රටෙහි සෞඛ්‍ය දත්ත සංසන්දනය වනුයේ ලොව දියුණු රටවල් සමග මිස සංවර්ධනය වෙමින් පවතින අනෙකුත් රටවල් සමග නොවේ. මෙම තත්වය ලඟා කර ගැනීම සඳහා ප්‍රසව හා නාරි වේද විශේෂඥ වෛද්‍යවරුන්ගේ විද්‍යායතනය විසින් කරනු ලැබූ මෙහෙය ඇති මහත්ය. ශ්‍රී ලංකාව තුල සියලු ප්‍රසව හා නාරිවේද වෛද්‍යවරුන්ගේ පශ්චාත් උපාධි පුහුණු වීම් කටයුතුද, හෙදියන්ගේ සහ වින්නඹු මාතාවන්ගේ පුහුණු කටයුතුද, එම සියලු ශිෂ්‍ය කණ්ඩායම් වල විභාග පැවැත්වීම සහ අධීක්ෂණයද, ඔවුන්ගේ සේවාස්ථ පුහුණු පාඨමාලා පැවැත්වීම සහ සේවය අධීක්ෂණය කිරීමද ඔවුන් හරහා සිදු වේ.

- මේ වනවිට “ශ්‍රී ලංකාවේ සූතිකාගාර සේවාව කෙසේ විය යුතුද?” යන්න ඉතාමත් තර්කානුකූල විද්‍යාත්මක වූ පදනමකින් යුක්තව පැහැදිලි කිරීමට ප්‍රසව හා නාරිවේද විශේෂඥ වෛද්‍යවරුන්ගේ විද්‍යායතනය ක්‍රියා කර ඇත.

- ඒ අනුව පවුල් සෞඛ්‍ය නිලධාරිනිය (වින්නඹු මාතාව) සහ සූතිකාගාර පුහුණුව ලැබූ හෙදිය යන සේවක කණ්ඩායම් වලින් බලාපොරොත්තු වනුයේ එකිනෙකට වෙනස් වූ කාර්ය භාරයන් දෙකකි. වින්නඹු මාතාව දරු උපත් සඳහා සහාය වන අතර, සූතිකාගාර පුහුණුව ලැබූ හෙදිය මගින් සංකූලතා බරපතල වීමට පෙර හඳුනා ගැනීමත් සහ ඒවා කඩිනම් වෛද්‍ය අවධානය සඳහා යොමු කරවීමත් බලාපොරොත්තු වේ.

- එහෙත් විශේෂඥ වෛද්‍යවරුන්ගේ විද්‍යායතනය මගින් ලබා දී ඇති ඉහත තාක්ෂණික උපදෙස් සෞඛ්‍ය සේවයේ කිසිදු තනතුරක් නොදැරූ, දරු ප්‍රසූතිය සම්බන්ධව කිසිදු අත්දැකීමක් නොමැති, එහෙත් ශ්‍රී ලංකාවේ සංඝරත්නය කෙරෙහි පවත්නා වූ අතිමහත් ගෞරවය අපයෝජනයකට ලක් කරන, හෙදියන්ගෙන් සමන්විත සංගමයක් මෙහෙයවන හිමි නමක් විසින් නොසලකා හැර සියලුම හෙදියන් වෘත්තීය සමිති ක්‍රියා මාර්ගයකට යොමු කර ඇත. මේ වනවිට රෝහල් බොහොමයක හදිසි සත්කාර සේවා ඔවුන් විසින් නවත්වා ඇති අතර ශල්‍යාගාර වල යතුරු සඟවා ගැනීමටත්, වැරදි යතුරු භාර දීමටත්, ශල්‍යාගාර උපකරණ සැඟවීමටත්, බෙහෙත් වර්ග වල ලේබල මාරු කිරීමටත් කටයුතු කර ඇත.

- මෙය ඉතා වැරදි සහගත ක්‍රියාවක් මෙන්ම දැඩි අපරාධයකි. ජාතියේ මව්වරුන් මිය යාමටත්, දරුවන් තිඹිරි ගෙයිහිදීම ආබාධිතයන් බවට පත් වීමටත් හේතු සලසන්නකි. ඉතිහාසයේ කිසිදු දිනක රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ කිසිදු වෘත්තීය සමිති ක්‍රියා මාර්ගයක් සඳහා සූතිකාගාර හෝ වෙනත් හදිසි ප්‍රතිකාර සේවා අඩාල කර නොමැති බව අප මෙහිදී අවධාරණය කරනු කැමැත්තෙමු. මාධ්‍යකරුවන් ලෙස මෙහි සැබෑ තත්වය රටට පවසන ලෙස අප ඔබගෙන් ඉල්ලා සිටිමු.

රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය. **03-05-2014**